# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**නිවාඩු කාලීන පැවරුම්**

**සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය**

# 3 ශ්‍රේණිය - පරිසරය (අගෝස්තු -3 සතිය)

**1 1 තේමාව - වැඩ පහසු කිරීමේ මං**

**පුංචි දරුවනි,**

- අතීතයේ දී සතුන් යොදා ගෙන වැඩ පහසුකර ගත් අවස්ථා දැක්වෙන වීඩියෝ දර්ශනයක් දෙමව්පියන්ගේ සහාය ඇතිව බලන්න.

උදා :- 1. කුඹුරු සී සෑම/ගොයම් කැපීම/සෙක්කුවේ බැඳීම ගවයන් යොදා ගැනීම.
2. අලි ඇතුන් කොට ඇදීම.
3. තවලම් යෑම.
4. සතුන් පිට නැඟ යෑම.(අශ්වයන්)
5. යුධ කටයුතු සඳහා (ඇතුන්, අශ්වයන්.)
6. වැව් අමුණු බැඳීමට. (අලි ඇතුන්)
7. පණිවිඩ යැවීමට (පරවියන්)

මෙම කාර්යයන් රංගනය සිදුකරන ආකාරය රංගනයක යෙදෙන්න. සතුටුවන්න.

## ඉස්කුරුප්පු නියන

ඉස්කුරුප්පු නියන් වර්ග කීපයක්ඇත.රූපයක් සොයා පහත අලවන්න. නැතිනම් අඳින්න.

- සාමාන්‍ය ඉස්කුරුප්පු නියන - සාමාන්‍ය ඉස්කුරුප්පු ඇණ ගලවීම හා සවි කිරීම.
- මල් ස්කුරුප්පු නියන - හතරට බෙදුණු කාණු සහිත ඉස්කුරුප්පු ඇණ ගලවීම හා සවි කිරීම.
- ටෙස්ටරය (පරීක්ෂකය ) - යම් ස්ථානයක විදුලිය තිබේද යන්න පරීක්ෂා කිරීම.

මෙම උපකරණ හොඳින් නිරීක්ෂණය කර ඇණ සවි කිරීමට හා ගැලවීමට අවස්ථාවලබා ගන්න.( ආරක්ෂාව ගැන සැලකිලිමත් වන්න.)